“ විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු ”

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.02.08 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

## මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක **GOS/ADM/6/2/19** හා **2022.01.31** දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | රා.ප. චක්‍රලේඛ 18/2020 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |
| 02 | රා.ප.චක්‍රලේඛ 03/2021 | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 අනුව පළාත් සංවර්ධන නිලධාරි සේවාවන් යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම |
| 03 | රා.ප. චක්‍රලේඛ 03/2016 (iv) | රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016 |
| 04 | රා.ප. චක්‍රලේඛ 02/2022 | රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම |
| 05 | රා.ප. චක්‍රලේඛ 22/2016 (i) | 2006.03.01 දින සිට 2007.07.01 දින දක්වා බඳවා ගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම |
| 06 | රා.ප. චක්‍රලේඛ 10/2015 (iv) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන) ,
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2016(I)

මගේ අංකය : CS/SLAS/LANG
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.01.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**2006.03.01 දින සිට 2007.07.01 දින දක්වා බඳවා ගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම**

2006.03.01 දින සිට 2007.07.01 දින දක්වා බඳවාගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් ඔවුන්ගේ පත්වීම් ලිපිය ප්‍රකාරව සම්පූර්ණ කළයුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය (දෙවන භාෂාව) නියමිත දිනට සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම නොසලකා, 2023.10.16 දක්වා වැටුප් වර්ධක ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බව දන්වමි.

02. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2016 අනුව පත්වීම් ලිපිය ප්‍රකාරව අනෙක් රාජ්‍ය භාෂාවේ, එනම් දෙමළ/සිංහල භාෂාවේ ප්‍රවීණතාවය සම්පූර්ණ කල යුතු දිනට පසුව අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වැඩිදුරටත් තීරණය කර ඇති බව දන්වමි.

I. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන ක්‍රියාත්මක වන 2017.12.31 දිනය දක්වා ශ්‍රේණි උසස් වීම් ලබා දීමේදී II ශ්‍රේණියට අදාළ උසස්වීම, අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය (දෙවන භාෂාව) සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2016 හි සඳහන් නියමිත දින සිට අමතරව ගනු ලබන කාලයට සමාන කාලයකින් ප්‍රමාද කිරීම.

II. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන අවසන් වන 2017.12.31 දිනයෙන් පසු ශ්‍රේණි උසස්වීම් ලබා දීමේදී 2023.10.16 දිනට පෙර අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය (දෙවන භාෂාව) සම්පූර්ණ කරනු ලබන නිලධාරියෙකු 2018.01.01 දිනට අදාළ අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇති නිලධාරියකු සේ සලකා කටයුතු කරනු ලැබේ.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිවය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය